ඩී.බී. කුරුප්පු ශූරීන්ගේ පසුගිය කස්තිරම පාඨක ඇසින් .....

මෙල්බන් ප්‍රජා ගුවන් විදුලිය, 3zzz සිංහළ සේවය පුරා වසර 20 ක තාරුණ්‍යයකට පිවිසීම සමරන්න ඔන්න මෙන්න කියා තිබියදී ඩී.බී. කුරුප්පු ශූරීන්ගේ අතුල් පහරකට පසුගිය මස සන්නස කස්තිරම තුලින් ලක්වීය. සංවේදී පාඨකයෙක් ලෙස ඊට ප්‍රතිචිරුද්ද මතයකට සන්නස වෙතින් ඉඩක් ඇද්ද? එසේ නොමැතිනම් කුමන හෝ හේතුවක් මූලික කර ගෙන සංස්කරණයකට ලක්කරාවිද යන සාධාරණ සැකයෙන් යුතුව ලියමි.

පොදුවේගත් කළ මෙල්බන් සිංහළ මාධ්‍ය කොයි එකේන් බැලුබැල්මටම එය කරවන්නන්ට ආනන්‍ය වූ පෞද්ගලික න්‍යාය පත්‍රයක් අඬු වැඩි වශයෙන් පහසුවෙන් දැකගත හැකිය. ඒ සඳහා ඕනෑ තරම් නිදසුන් ඇති නමුත් මාතෘකාව තුල රැඳෙනු ඊසියේන් පසුවට තබමි. මේ සඳහා තම ගොඩ තර කර ගැනීමේ කාර්යයේ යෙදෙන සම්පත් දායකයන්ගේන්ද මනා රුකුලක් මාධ්‍ය කරවන්නන්ට හිමි වන්නේ නිරායාසයෙනි. ඒ තුලින් මෙල්බන් ශ්‍රී ලාංකික ප්‍රජාව දිශානුගත කිරීමේ නිෂ්ඵල වෑයමේ නියෙලෙන්නන් දක්නට ලැබේ. එය නිෂ්ඵල වන්නේ මධ්‍ය පෙර ගමන් කරු වෙනුවට වලිගයක් ඒ ඇති නිසාවෙනි. මේ සඳහා පසුගිය කළාප තුලින් නිදසුන් ගෙන හැර පෑ හැක. මෙම හර සුන් වෙණ ගායනා හාස්‍ය ජනක සිද්දීන් ලෙස විදින මෙල්බන්හි බහුතර ශ්‍රී ලාංකික ප්‍රජාව ලියන්නාන්ට වඩා බොහෝ ඉදිරියෙන් සිටී.

මේ සියල්ල සිදුවෙද්දි තම අත්දැකීම්, පරිනතව විවිධ මාතෘකා ඔස්සේ මොනවට කියා පාමින් නොකඩවා ලියන උගත් පිරිසක් සිටීම සැනසිල්ලට කරණකි. පසුගිය සන්නස කස්තිරම තුලින් ඩී.බී. කුරුප්පු ශූරීන්ගේ අපේ ගුවන් විදුලිය ගැනයි... යන ලිපිය තුලින් මා හට මූලික කාරණා කිහිපයක් විද්‍යාමාන විය.

* පෙර සන්නස ලිපිය (200 අග භාගයේ) සම්බන්ධව, 3zzz සිංහළ අංශ බළධාරීන් නගන ලද ප්‍රශ්න දෙක.
* ප්‍රසන්න නාමල්ගේ විමසුම.
* ප්‍රසන්න වෙනුවෙන් පෙනී සිටීම.
* ඩී.බී. කුරුප්පු ශූරීන්ගේ මිනුම් දණ්ඩට අනුව 3zzz සිංහළ අංශය අද වැටී ඇති තත්ත්වය සම්බන්ධව ඔහුගේ සුසුම් ලෑම.

ඩී.බී. කුරුප්පු ශූරීන්ම පවසන අන්දමට 3zzz සිංහළ අංශය සම්බන්ධව 2008 අග භාගයේදී සන්නස පුවත් පතට ලියන ලද ලිපිය සම්බන්ධව එහි බලධාරීන් විමසූ බවත්, ඒ සඳහා පිලිතුරු දුන් ආකාරයත් සඳහන් වේ. පලමු ප්‍රශ්ණය සඳහා සෘජු මෙන්ම තර්කාණුකූල පිලිතුරක් ද ඇති බව සැබෑය. නමුත් දෙවැන්නට එදා මෙන්ම පසුගිය ලිපිය තුලිනුත් ඇඟට දැනෙන පිලිතුරක් දීමට ඔහු අපොහොසත් වීම පුදුමයක් ලොවේ. සමහර විට ඔහුට එවැන්නක් සොයාගැනීමට නොහැකි වුවා විය හැකියි.

ඒ කෙසේ වෙතත් ඩී.බී. කුරුප්පු ශූරීන් මෙල්බන් කේන්ද්‍ර කර පල වන සිංහළ පුවත් පත් දෙකෙහිම සම්පත් දායකයෙක් ලෙස ලිපි සපයයි. ඒ අතරින් "පහන" මාසිකය තුල ඔහුට නිශ්චිත ස්ථානයක් හිමි වේ. පහත පිරිවරහි මුල්තැන වෙන් වී ඇති බව "පහන" සංස්කාරක සටහන සමඟ ඇති කාරිය කරවන නම් ලැයිස්තුව අනුව පැහැදිලි නමුත් "සන්නස" තුල ලිඛිත සටහනකින් ඔහුගේ ස්ථානය වෙන්කර නැති නමුත් 3zzz සිංහළ සේවය සම්බන්ධ පසුගිය ලිපි දෙකම සම්පාදනය කිරීම "සන්නසටම" වීම සුවිශේෂයි. එබැවින් වඩාන්නකට දොර විවර වීම "සන්නස" වෙතින්ම පමණක්දැයි මට දැනුනු හැඟීම සැකයෙන් තොරයි. පාඨකයෙක් ලෙස මට දැනුනු සංවේදිත්වය මධ්‍ය කරණයේ යෙදෙන්නන් ලෙස 3zzz සිංහළ සේවා බළධාරීන්ට අඩුම කුඩුම නැතුව දැනුනාට කිසිදු සැකයක් නැත. එබැවින් කාගේවත් ඉගැන්වීම් බහතට හෝ උසිගැන්වීමකට ලියන ලද්දක්දැයි 3zzz සිංහළ සේවා බළධාරීන් ඩී.බී.ගෙන් විමසීම පුදුමයක් නොවන්නේ පසුගිය ලිපියද තරමක උත්තේජනයකින් පසුව සම්පාදනය කර ඇති බවක් පෙනීයන හිසාවෙනි. වහර බසින් ලියොතොත් ඩී.බී. ව use කර ඇති බවක් පෙනී යයි.

පොදුවේගත් කළ මෙල්බන් සිංහළ මාධ්‍ය කොයි එකේන් බැලුබැල්මටම එය කරවන්නන්ට ආනන්‍ය වූ පෞද්ගලික න්‍යාය පත්‍රයක් අඬු වැඩි වශයෙන් පහසුවෙන් දැකගත හැකිය. ඒ සඳහා ඕනෑ තරම් නිදසුන් ඇති නමුත් මාතෘකාව තුල රැඳෙනු ඊසියේන් පසුවට තබමි. මේ සඳහා තම ගොඩ තර කර ගැනීමේ කාර්යයේ යෙදෙන සම්පත් දායකයන්ගේන්ද මනා රුකුලක් මාධ්‍ය කරවන්නන්ට හිමි වන්නේ නිරායාසයෙනි.

ඩී.බී. කුරුප්පු ශූරීන්ගේම තර්කයට අනුව විමසුමකට වාර්ථාකරණය අභිබවායාමක් අවැසි බව ප්‍රකාශ කරයි. එය බැහැර කළ නොහැකි තර්කයකි. එනමුත් ඒ සඳහා මාතෘකා තෝරා ගැනීම මෙන්ම ඒක් ආනයතක් පමණක් දැඩි විවේචනයකට ලක් කිරීම දේශපාලන කරණය යැයි කිව හැක.

පසුගියදා ලක්ෂමන් වැලිවිටියගේ උඩුග ගඩලා සංයුක්ත තැටිය එලිදැක්වීම දියාරු කිරීම කස්තිරමට තියා විමසුමටවත් වගේ වගක් නොවීම පාඨක අපට දැඩි විමසුමකට කරුණක් විය.

මාධ්‍ය කරණය සඳහා සම්පත් දායකයින් තෝරාගැනීම සඳහා ප්‍රේමදාස කරණය නිදසුනක් ලෙස අරගත් ගන්වා පෙන්වීම ඩී.බී. කුරුප්පු ශූරීන් වැන්නෙකුට නොවරියි. මන්ද ප්‍රේමදාස යුගයේ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ වරයාව පත් කිරීම ප්‍රේමදාස ජනාධිපති වරයා විසින්ම සිදුකළ අතර ඔහුට පෙරකී ක්‍රියාකාරී අධ්‍යක්ෂ වරයාව මුණගැසීම සිදුව ඇත්තේ පන්සලක මල්වරිටි වෙන්දේසියකදියි. දශක කිහිපයක් දැතට හුරු වීරදු රඹානත් මයිකෝෆෝනය අභියස හිටිවන කවි වීරදු ගයාමධ්‍ය කරණයේ අත්දැකීම් ඇති ඔහු හැරුණු කොට ප්‍රේමදාස ජනාධිපති වරයාට වෙනත් සුදුස්සෙකු ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුරට සොයාගත නොහැකි විය. ප්‍රේමදාස ජනාධිපතිවරයා මල්වරිටියට කොතෙක් ඇළුම් කළාද යන්න එකළ මුදුන මාධ්‍ය කාටුන් තුලින් වාර්ථා කර තිබිනි. එවන් සම්පත් දායකයින් සොයායෑම මෙපුරත් පහසු කටයුත්තකි. මෙල්බන්හි සමහර මධ්‍ය තුල එකිකොගේ පිට කසා ගැනීමේ කලාව හැර වෙනකක් දක්නට නොමැති එම කණගාටුවට කරුණකි.

3zzz සිංහළ සේවය අන් කරවදාටත් වඩා පහත වැටී ඇති බව ඩී.බී. කුරුප්පු ශූරීන් පවසයි. ඔහුගේ මිණුම් දණ්ඩට අනුව ඒකකය ප්‍රසන්න සහ විමසුමයි. එනමුත් වරෙක ඔහු නිවේදකයෙක් විසින් සම්මුඛ සාකච්ඡාවකට සහභාගී වූ ස්වාමීන් වහන්සේ නමක් හඳුන්වා දීමේදී වර්ණනාව නවතා ගැනීමට නොහැකිව රහත් ගන්වන්නට ගිය අවස්ථාවක් සටහන්කර තිබිනි. කාරණාව සැබැවකි. මන්ද එම වැඩසටහන මාද සවන් දී තිබිනි. එනමුත් එම අඬුව පෞද්ගලිකව එම නිවේදකයාට දැනුම් දීම වෙනුවට පුවත් පතකට සටහනක් තැබීම ඩී.බී. කුරුප්පු ශූරීන් වැනි දැවැන්තයෙකු දෙවරක් සිතා බැලිය යුතුව තිබිනි.

පසුගිය කාළවකවානුව තුල පෞද්ගලිකත්වය අභිඔවා පොදු කාරණා ඔහු විසින් නොලිවීමට හේතුව වසර කිහිපයකට ඉහතදි මෙල්බන්හි දේශපාලනීය වූ අපේ ප්‍රජා ගුවන් විදුලියට ඔහු සවන් නුදුන්නා වීම විය හැකියි.

එසේ වුවද විමසුම වෙනුවෙන් ඔහු-ගේ හඬ අවදිවීම ගැටළු සහගතයි. එය මගේ විමර්ශණයට හසු නොවන්නකි. ඒ හඬ ගෑම තම ගොඩ වෙනුවෙන්ද? ඩී.බී. වැන්නෙකු එසේ විය නොහැක. කෙසේ වෙතත් නවීකරණය වූවිකල්ප යෝජනාවක අඬුව ලිපිය අසම්පූර්ණ බව කියා පාන අතර විමසුම මත යැපිම තවදුරටත් ස්ථිර කිරීම සඳහා කරුණු පෙළ ගස්වයි. ඒ ඔහුගේ වෙනස් වීමට ඇති අකමැත්ත මොනවට කියා පායි.

සංවාදයකට විවෘතයි.

සුරන්ජිත අතුකෝරළ
suranjithathukorala@yahoo.com.au

ඔබ සියලුදෙනාම මේ පන්තියේද...?

රට හා ජාතිය ගැනත් අපගේ අභිමානය ගැනත් උදම් අනමින් විශාල සේවයක් කරන කාගේත් හොඳ හිත දිනාගන වැඩ කිරීමට වෙර දරණ මෙල්බන්හි විශාල සාමාජික පිරිසක් සිටින සංගමයකින් වැඩි පිරිසක් කැමැත්ත දි අපගේ පොදු ගුවන්විදුලිය පාලනය කරන බව නොරහසකි.

අපගේ ශබ්ද ඝෝශය සුනාමියකට හසුවීද?

බාලවියේ දරුවෙකුට මවුබස ලැබෙන්නේ ප්‍රථම වතාවට මවගෙන් සහ පියාගෙනි.ඒ වටිනා සිංහල භාෂාවේ පෞඪත්වය ගාම්භීරත්වය රසවත් බව හා අර්ථවත් බව මේ දරුවනට කියාදෙන්නට ගුවන් පාවී එන මේ හඬ ඇසීමට සැලැස්විය හැකිද?.. පුරන් වී ගිය කුඹුරක තැන තැන පැලවුන ගොයම්ගසහි හැදුන බොල් වී කරලක ගිරවෙකුවත් වසන්ද?.....

රාජ්‍ය පාලකයෙකු අනවෙරය ගසන්නට ගොළුවෙක් යොදා ගත්තා සේ මට පෙනේ.

සී.බී. කුරුප්පු මහතා මේ අය නිවැරදි මගකට යොමු කරන්නට වෙරදරන බව පෙනේ. ගුවනට සවන්දෙන එකම නැනවතෙක් හෝ මෙසේ ලිවීම පසසුමට කරුනකි. ඔබට මගේ ප්‍රනාමය. මාද බලා සිටිනුයේ දියේ ගිලුන මේ දරුවා කොතනින් හෝ අනේ මතුවේවිද නොයිවසිල්ලෙනි. කුරුප්පු මහතාගේ පලමු ලිපියේ හිටපු ගිරවු වසා සිටි අත්ත කපන රූපයක් මට මතකය. මෙවරද ලිපියක් ඇතිබව කන වැටුන මා පුවත්පත පෙරලුවේ උපතින්ම හොට අහිමි ගිරවෙක් කතා කිරීමට උත්සාහ ගන්න පින්තූරයකි... වරෙක මෙසේද මට සිතේ. ගෙදරට එන අය පිළිගන්න ගිරා කූඩුව ගේ ඉදිරිපස මල්ලිටි එල්ලීම අනුවන කමකි. ස්වාමීන් වහන්සේ නමක් වැඩියද හොරෙක් හොරෙක් කීම ගිරවාගේ සිරිතය. මේ ගිරවා දුරකථන ඇංක පුරුදු උනේ ඉංගිරිසි භාෂාවෙන් නිසා සිංහලෙන් කීමට නොහැක.

පරන සමාජ නිවේදන වලට වචන සීමාව කීයද?....

සමාජ දියුනුවත් සමඟ මෙල්බන් සති අන්තවල සිදුවෙන කටයුතු ඉතා බහුලය. ගුවන් විදුලිය ඇසුවත් නැතත් අද ශ්‍රී ලාංකික ජනතාව එකාමෙන් අවදි වී සිටින කලක් බව නොරහසකි. මේ කටයුතු ගුවන් විදුලියෙන් ප්‍රචාරය කිරීමට ඒ සියලු අය කැමති බවත් නොරහසකි. ඒත් ඒ නිවේදනවල වචන සීමා කරන්නේ ගුවන පාලනය කරන අයනම් කල යුත්තේ නිසි බලය පාවිච්චි කර අන්තර් ගනයට හානි නොවනසේ ගුවනට ගැලපේනසේ නිවේදනය සැකසීමය. ගිරවාගේ ගෙදර මංගල්‍යය නිවේදන තුනකට කඩා වචන සීමා කරගන එලියට නීතිය පැනවීම හරියට දේවාලයේ කපුවාට වත්ත හතරමායිමේ කොතැන උනත් මළපහ කලහැකිය කීවා සේය. පුරුදද්ක් වශයෙන් ගමේ ගොවියාට කෑමට කුණු කරවල කෑල්ලක් බතට එන කිව වගේ හැමදාම එකක් හෝ දෙකක් හිමාවූ උත්සවයක නිවේදන කියවන්නේ වේලාව ගෙවා දමන්නදෝ මට සිතේ.

අසාරවත් බවක්....

ගෙවී ගිය කාලය තුල මට දක්නට ලැබෙන්නේ වෙරළක තැනූ පුංචි මාලිගාවක් දෙස අසාවෙන් බලා සිටින නොදරුවන් රැලක් රළ වැදී ටික ටික මාලිගාව සේදී යන අයුරු සිනා සෙමින් බලා සිටින අයුරුය. විශාල රළක් වැදී විශාල කොටසක් කඩා හැලෙන විට සියලුදෙනාම කොක් හඬලා සිනා සෙන අයුරුද මට පෙනේ. මේ මාලිගය බිමට සමතලා වූ පසු වට පිට බලන ඔබට අදුරු වැටී ඇති බව පෙනේ. දැන් කල යුත්තේ ගෙදර යාම පමණකි. සියලු සම්පත් වලින් සපිරි බුද්ධිමත් සමාජයක් තුල මෙවන් අසාරවත් ගමනකටද මුතුන් මිත්තන් සටහන් කළේ මෙම ගුවන් විදුලිය එසේ හානියකට ලක්වීමට ඉඩදී බලා සිටීමට අපට හැකිද? විද්වත් සිංහල හිතිහාසයකින් හිස පුරවාගත් ඩී.බී. කුරුප්පු මහතානනි ඔබ අනුමත කිරීමට මා මෙසේ එකතු වෙමි.

සියපා සතෝ හෝ පාගා දමයි හෙට
පිට ගැට කුදෝ එය කීමේ කපුද ත ට
කුස නැති එකෙක් එය හඬගා කීය
මට දත සුදු මාමේ මා අරගත් ගහ උඩට

ගැමි සිංහල වහර අපූරුවට හෙලි කරන මේ කවිය අපගේ සිංහල සාහිත්‍යයට එකතු වූ සරල පුංචි කවියක් උවද මෙහි අරුත ඉතා ගැඹුරුය. පුංචි තිරිසන් සතන් දෙදෙනෙක් වන හැකරැල්ලා සහ ගොළු බෙල්ලා අතර ඇති වූ දෙබසකි කවියෙන් කියවෙන්නේ. සියපා සතා හැකරැල්ලාද පිට ගැට කූදා ගොළුබෙල්ලාද වේ. මේ දෙදෙනාම අදුර වැටුන පසු කෑම සොයා එලි බසින අතර ගමනින් ගොලුබෙල්ලා හැකරැල්ලාට වඩා වේගය අඩුය. එදින හවස අනබෙර කරුවකු රජතුමා හෙට උදේ වීදි සංචාරය කරන බව පවසමින් පාරේ යනු ගොළුබෙල්ලාට ඇසින. අදුර වැටෙත්ම, කෑම සෙවීම පිනිස පාර දිගේ යන ගොළුබෙල්ලාට හැකරැල්ලා මුණ ගැසින. හැකරැල්ලාට ගොළුබෙල්ලා පැවසුවේ ඉක්මනට කෑම අරගන ගෙදර පලයන් උදේම රජුගේ වීදි සංචාරය නිසා උඹව පාගල දමයි කියාය . . එය පිළිගත් හැකරැල්ලා ගොළුබෙල්ලාගෙන් සමුගෙන ජීවිතය බේරා ගැනීමට වටපිට බැලූ විට ගසක් උඩ සිටින වදුරෙකු දටුවෙමි. වදුරාට කථාකොට කතාව පැවසූ පසු වදුරා බිමට බැස හැකරැල්ලා රැගෙන ගහ උඩට නැග්ගේය. අත දිග හැර බැලූ වදුරා දුටුවෙමි බෝලයක් සේ වකුටු වී ඇති හැකරැල්ලාය පුංචි ශබ්දයකට උවත් හැකිලී රෝල්වන සිරිත හැකරැල්ලාටද අමතක විය. වදුරාට මැජික් එකක් වූ මේ හැකරැල්ලා දිග හරින්නට උත්සහ කලල සිදු වන්නේ හැකරැල්ලා තව තවත් හැකිලීමය. අවසානයේ කෑලි වලට කැඩී හැකරැල්ලා මිය ගිය අතර හැකරැල්ලාටත් සෙමින් ගමන් කරන උපදෙස් සැපපෑ ගොළුබෙල්ලා උදෑසන පැමිණි පෙරහරේ අස්වයන්ට පැගී මිය ගියේය. මෙවන් කවි අපගේ සාහිත්‍යයට එකතු උනේ හැම කාලයකටම ගැලපෙන නිසාය... කුරුප්පු මහතානනි මේ සිනහව හද පත්ලෙන්ම හැඟෙන සිනහවක් බව ඇත්ත ඒත් සිනහව අවසානයේ හැමදෙනාම සිනාසුනේ කුමකටද යන්න සිතා බැලීම වටී.

එස් මැතිව්
ඩැඩ්ඩිනොං